# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2019

2023 ජුනි

සමාජීය විද්‍යා පීඨය

මානව විද්‍යාව

## මානව විද්‍යාව හැඳින්වීම ANTH 18214

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. මානව විද්‍යාව විෂය හැදෑරීමේ කාලීන වැදගත්කම උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

02. භෞතික මානව විද්‍යාවේදී වැඩි අවධානයක් යොමුකරන විෂය පථයන් හඳුන්වා එම විෂයන්ගෙන් භෞතික මානව විද්‍යාවට ලැබෙන පිටිවහල උදාහරණ සහිතව විමසන්න.

03. ශ්‍රී ලාංකීය සමාජයේ බහුභාණ්ඩ සංස්කෘතීන් ඇසුරින් සමාජය පිළිබඳව අවබෝධ කරගත හැකි ආකාරය විස්තර කරන්න.

04. සංස්කෘතියක් යනු කුමක්දැයි අධ්‍යයනය කිරීමේ වැදගත්කම පැහැදිලි කොට යම් සංස්කෘතියක දැකිය හැකි කැපී පෙනෙන ලක්ෂණ මොනවාදැයි උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

05. මානව විද්‍යාව විෂය සඳහා කෞතුකාගාර අධ්‍යයනය කොපමණ දුරට වැදගත්වේද යන්න පැහැදිලි කොට ශ්‍රී ලංකාව තුළ මානව විද්‍යා කෞතුකාගාර නිර්මාණය කිරීමට ඇති හැකියාව පිළිබඳව විමර්ශනය කරන්න.

06. වර්තමානයේදී මානව විද්‍යාත්මක පර්යේෂණ සඳහා දෘශ්‍ය මාධ්‍ය කොතරම් දුරට පිටිවහලක් වේදැයි කාලීන උදාහරණ සපයමින් සාකච්ඡා කරන්න.

07. ඔබ මානව විද්‍යාව විෂය හදාරන්නෙක් වශයෙන් ශ්‍රී ලංකාවේ විවිධ සාම්ප්‍රදායික ආහාර සංස්කෘතීන් අධ්‍යයනය කිරීම වැදගත් වන්නේ මන්දැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

08. මෙරට හඳුනාගත හැකි සාම්ප්‍රදායික ක්‍රීඩාවන් මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කොට ඒවා පිළිබඳව මානවවිද්‍යාත්මක වශයෙන් අධ්‍යයනය කිරීමේ වැදගත්කම උදාහරණ සපයමින් විමසීමක් කරන්න.

*************************************